සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

# ලංකා ඉතිහාසය I

කාලය පැය එකයි.

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## 1 කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. මහා භාරතය 2. දිව්‍යාවදානය 3. රාජතරංගනිය 4. සීලප්පදිකාරම් 5. කෛලාසමාලය (.....)

02. 1. භාරුකච්ඡ 2. ගෝකණ්ණතිත්ථ 3. මහාතිත්ථ 4. කාලතිත්ථ 5. සූකරතිත්ථ (.....)

03. 1. වල්ලිපුරම් 2. පෙරුමියන්කුලම 3. හබැස්ස 4. සැස්සේරුව 5. තම්මැන්නාව (.....)

04. 1. පිදුරංගල 2. කිතුල්ගල බෙලිලෙන 3. බටදොඹලෙන 4. පාහියංගලලෙන 5. මානියංගම (.....)

05. 1. සූරතිස්ස 2. අසේල 3. වලගම්බා 4. වසභ 5. මිත්තසේන (.....)

06. 1. අනුලා 2. චූලසීවලී 3. සුගලා 4. ලීලාවතී 5. කළ්‍යාණවතී (.....)

07. 1. සේන ගුත්තික 2. එළාර 3. පුලහත්ථ 4. පාරින්ද 5. කාලිංග මාඝ (.....)

08. 1. ගම්පොළ 2. සිදුරුවාන 3. රයිගම 4. මාතලේ 5. දෙනුවර (.....)

09. 1. පළමුවන විමලධර්මසූරිය 2. දෙවන විමලධර්මසූරිය 3. පළමුවන රාජසිංහ 4. දෙවන රාජසිංහ 5. ශ්‍රී විජය රාජසිංහ (.....)

10. 1. දොන් ජෙරනිමෝද අසවේදු 2. කොන්ස්තන්තීනූද බ්‍රගන්සා 3. දොන් ප්‍රැන්සිස්කෝ ද මැනසීස් 4. රයික්ලොෆ් ෆන් හුන්ස් 5. මැනුවෙල් මස්කරඤ්ඤස්(.....)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල පද යුගල 05 බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. 1. මල්වතුඔය - නාච්චාදූව වැව
 2. යාං ඔය - හුරුළු වැව
 3. කලා ඔය - කලා වැව
 4. කනදරා ඔය - මහගල්කඩවල වැව
 5. දැදුරු ඔය - යෝධ වැව (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

12. 1. තෝනිගල සෙල්ලිපිය - වසරකට කන්න තුනක් වගා කළ බව
2. බෝවත්තේගල සෙල්ලිපිය - ප්‍රාදේශීය රජපෙළපතක් පිළිබඳව
3. ගොඩවාය සෙල්ලිපිය - වරාය බදු
4. හෝපිටිගමු ටැම්ලිපිය - වෙළඳපොළක පාලන නීති
5. සිතුල්පව්ව සෙල්ලිපිය - ඇමති තනතුරු පාරම්පරිකව උරුම වූ බව (.....)

13. 1. රිබෙයිරෝ - ලංකාධිපත්‍යය
2. බැල්දියස් - ලංකා පුරා වෘත්තය
3. රොබට් නොක්ස් - එදා හෙළදිව
4. ජෝන් ඩොයිලී - සිංහලේ ආණ්ඩු ක්‍රමය
5. එමර්සන් ටෙනන්ට් - ලංකාව දිවයින පිළිබඳ විස්තරයක් (.....)

14. 1. 1469 - මහනුවර ස්වාධීන රාජධානියක් වීම.
2. 1505 - පෘතුගීසින් ලංකාවට පැමිණීම.
3. 1521 - විජයබා කොල්ලය
4. 1562 - උඩරට රාජධානිය සීතාවකට ඈඳා ගැනීම.
5. 1619 - යාපනය රාජධානිය පෘතුගීසින් විසින් යටත් කර ගැනීම. (.....)

15. 1. ෆෙඩ්රික් නෝර්ත් - රාජකාරි ක්‍රමය අවලංගු කිරීම.
2. තෝමස් මේට්ලන්ඩ් - සිවිල් සේවාව ප්‍රතිසංස්කරණය කිරීම.
3. රොබට් බ්‍රවුන්රිග් - උඩරට රාජධානිය යටත් කර ගැනීම.
4. එඩ්වඩ් බාන්ස් - මුඩු බිම් පණත හඳුන්වා දීම.
5. විල්මට් හෝර්ටන් - කොල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම. (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකශන/ දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇති නාම/ ප්‍රකශන/ දින වකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරය X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරැදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| X | | Y |
|---|---|---|
| 1. දම්පිය අටුවා ගැටපදය | A | දඹදෙණිය |
| 2. අමාවතුර | B | අනුරාධපුර |
| 3. කව්සිළුමිණ | C | කුරුණෑගල |
| 4. දළදා සිරිත | D | මහනුවර |
| 5. මන්දාරම් පුර පුවත | E | පොළොන්නරුව |

1. BEDAC 2. BEACD 3. DEABC 4. EBADC 5. CEABD (.....)

17.

| X | | Y |
|---|---|---|
| 1. දේවනම්පියතිස්ස රජතුමා | A | වෙල්ගම්වෙහෙර |
| 2. කාවන්තිස්ස රජතුමා | B | ලංකාරාමය |
| 3. වලගම්බා රජතුමා | C | ථූපාරාමය |
| 4. මහසෙන් රජතුමා | D | උත්තරාරාමය |
| 5. මහා පරාක්‍රමබාහු රජතුමා | E | ගෝකණ්ණ විහාරය |

1. CEABD 2. EDABC 3. BAECD 4. CABED 5. DAEBC (.....)

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

| | X | | Y |
|---|---|---|---|
| 18. | 1. කින්නර බද්ද | A | ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| | 2. කුරුවේ බද්ද | B | ප්‍රවාහන කාර්යාංශය |
| | 3. මඩිගේ බද්ද | C | කුඹල් කාර්යංශය |
| | 4. කොට්ටල් බද්ද | D | විවීමේ කාර්යංශය |
| | 5. බඩහැල බද්ද | E | අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |

1. DEBAC 2. EDACD 3. DEACB 4. DCAEA 5. BAECD (.....)

| | X | | Y |
|---|---|---|---|
| 19. | 1. මුල්ලේරියාවෙල සටන | A | කොන්ස්තන්තිනු ද සා |
| | 2. දන්තුරේ සටන | B | දොන් ජෙරනිමෝ ද අසවේදු |
| | 3. බලන සටන | C | පේරෝ ලෝපේස් ද සූසා |
| | 4. රන්දෙනිවෙල සටන | D | දියෝගු ද මේලෝ කැස්ට්‍රෝ |
| | 5. ගන්නෝරුව සටන | E | අපොන්සු පෙරෙයිරාදලසර්දා |

1. ECBAD 2. DEBAC 3. CAEBD 4. EDABC 5. CAECD (.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. | 1. කීර්ති කුමාරයා | A | ශ්‍රී වික්‍රම රාජසිංහ |
| | 2. මහා අස්ථාන කුමාරයා | B | පළමුවන විජයබාහු |
| | 3. කන්නසාමි කුමාරයා | C | පළමුවන රාජසිංහ |
| | 4. සපුමල් කුමාරයා | D | දෙවන රාජසිංහ |
| | 5. ටිකිරි කුමාරයා | E | හයවන බුවනෙකබාහු |

1. EDABC 2. DEABC 3. BDAEC 4. CDBEA 5. DCAEB (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ යොදන්න.**

21. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස
    1. ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ මුල්ම ඉන්දියානු සංක්‍රමණික කණ්ඩායම වයඹ දිග ඉන්දියාවේ සිට පැමිණි බවට විශ්වාස කෙරේ.
    2. මුල් ආර්ය ජනාවාස ව්‍යාප්ත වූයේ වයඹ දිග ලංකාවේ කදම්බ නදිය හා ගම්භීර නදිය ආශ්‍රිතවය.
    3. සලාවන්තොටින් ලංකාවට ගොඩබැස්ස පණ්ඩුවාසදේව ඇතුළු පිරිස දැදුරු ඔය අසබඩ ජනාවාස පිහිටුවා ගත්හ.
    4. භද්දකච්චායනා කුමරියගේ සහෝදරයින් මහවැලි ගඟින් දකුණට ජනාවාස ව්‍යාප්ත කළ බව මූලාශ්‍ර වලින් තහවුරු වේ.
    5. ක්‍රි.පූ. 6 වන සියවස අවසන් වන විට නැගෙනහිර සිට බටහිර වෙරළේ කළ්‍යාණි දක්වා ආර්ය ජනාවාස ව්‍යාප්තිය සිදු වී තිබුණි. (.....)

22. ශ්‍රී ලංකවට බුදු දහම හඳුන්වා දීම,
    1. තුන්වැනි ධර්ම සංගායානාව හා ඉන්දියාවෙන් බැහැරට ධර්මය ප්‍රචාරය කිරීම.
    2. අශෝක අධිරාජ්‍යා සමඟ දේවනම්පියතිස්ස රජතුමා පැවැත් වූ මිත්‍ර සබඳතාව
    3. අශෝක අධිරාජයා අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියේ යුදමය මුහුණුවර වෙනුවට ධර්ම විජය ප්‍රතිපත්තිය තෝරා ගැනීම.
    4. ඉන්දියාවට මුස්ලිම් ආක්‍රමණ සිදු වීම.
    5. ශ්‍රී ලාංකික දූත පිරිසක් ඉන්දියාවට යවා රාජ්‍ය තන්ත්‍රික සබඳතා ගොඩ නැගීම. (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WP EXAM

23. කාවන්තිස්ස රජු යටතේ රෝහණ ව්‍යාප්තිය
1. ප්‍රාදේශික රාජධානි රෝහණයට ඈඳා ගැනීම සඳහා ආගමික ක්‍රියාමාර්ග උපායශීලීව යොදා ගැනීම.
2. විහාරමහා දේවිය විවාහ කර ගැනීමෙන් බටහිර වෙරළේ බලවත් රාජ්‍යයක් වූ කල්‍යාණිය සමඟ සබඳතා ගොඩ නගා ගැනීම.
3. යුදමය ක්‍රියාමාර්ග හා බියවැද්දීම් මගින් කුඩා ප්‍රාදේශික පාලන ඒකක යටත් කර ගැනීම.
4. සද්ධාතිස්ස කුමරුට දීඝවාපියේ පාලනය බාර දී රෝහණයේ දේශ සීමා නැගෙනහිර දක්වා ව්‍යාප්ත කිරීම.
5. මාගම රුහුණේ එකම රාජධානිය කිරීමේ අරමුණකින් කතරගම දසබෑ රජවරු ඝාතනය කල බව බෝවත්තේගල සෙල්ලිපියේ දැක්වීම. (.....)

24. රජරට ශිෂ්ටාචාරයේ බිඳ වැටීම,
1. රුහුණෙන් එල්ල වූ දේශපාලන තර්ජන හා කැරලි කෝලාහල
2. දුර්වල පාලකයින් බලයට පත් වීම.
3. රජ පෙළපත් අතර ඇති වූ බල අරගල
4. රජවරු සිංහාසන බල අරගල වලදී දකුණු ඉන්දියාවෙන් කුලී හමුදා රැගෙන ඒම.
5. අස්ථාවර දේශපාලන වාතාවරණය හේතු කොටගෙන ආර්ථිකය දුර්වල වීම. (.....)

25. මහනුවර රාජධානියේ ආර්ථිකය,
1. පාරිභෝජනය පදනම් කරගත් කෘෂිකාර්මික ආර්ථික රටාවක් පැවතීම.
2. වර්ෂා ජලයෙන් වී වගාව සිදු කිරීම හා සුළු වශයෙන් වාරිමාර්ග පැවතීම.
3. හේන් වගාවට ප්‍රමුඛත්වයක් හිමි වීම.
4. වෙළඳාම හා කර්මාන්ත පවත්වා ගෙන යෑම.
5. විදේශ වෙළඳාමේ දී දෙමළ ජාතිකයන් අතරමැදියන් ලෙස කටයුතු කිරීම. (.....)

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A,B, C, සහ D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
A සහ C පමණක් නිවැරදි නම් 2 ද,
B සහ C පමණක් නිවැරදි නම් 3 ද,
C සහ D පමණක් නිවැරදි නම් 4 ද,
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | Cසහ D පමණක් නිවැරදිය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

26. අනුරාධපුර අවධියේ විදේශ සම්බන්ධතා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේද?
A අනුරාධපුර අවධියේ මුල්කාලීන විදේශ සබඳතා උතුරු ඉන්දියානු දේශපාලනය සමඟ බැඳී පැවතුනි.
B ලංකාව බුදු දහම පැමිණීම හා මුල්බැස ගැනීම තුළින් රාජ්‍ය පාලනයට හා සංස්කෘතියට උතුරු ඉන්දියානු බලපෑම් ඇති විය.
C අනුරාධපුර අවධියේ පශ්චාත් සමය වනවිට දකුණු ඉන්දීය බලපෑම් හා ආක්‍රමණ එල්ල වූ අතර ක්‍රමයෙන් උතුරා ඉන්දියානු බලපෑම් අඩු විය.
D ලංකාවේ රජවරු ඉන්දීය යුධ ආධාර ලබා ගැනීමත් දකුණු ඉන්දීය බල අරගලවල දී ලංකාවෙන් යුද ආධාර ඉල්ලා සිටීමත් දැකිය හැකිය. (.....)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

27. හය වන පරාක්‍රමබාහු රජුගෙන් පසුව කෝට්ටේ රාජධානියේ දේශපාලන තත්වය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A හයවැනි පරාක්‍රමබාහු රජුගේ මුණුබුරා වූ ජයබාහු කුමරා හත්වන වීර පරාක්‍රමබාහු නමින් කොට්ටේ රජවිය.

B ජයබාහු කුමරුගේ රාජ්‍යපද ප්‍රාප්තියට එරෙහි වූ සපුමල් කුමරා රාජ්‍ය බලය පැහැරගෙන හයවන බුවනෙකබාහු නමින් රජ විය.

C සපුමල් කුමරුගේ ක්‍රියා කලාපයට එරෙහිව අම්බුළුගල කුමරුගේ නායකත්වයෙන් සිංහල සංගය ඇති විය.

D හයවැනි විජයබාහු රජුගේ පාලන සමයේ දී පෘතුගීසීහු කෝට්ටේ බලය තහවුරු කර ගත්හ. (.....)

28. පෘතුගීසීන් හා මහනුවර රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ **නිවැරදි** වේද?

A සේනා සම්මත වික්‍රමබාහු රජු මහනුවර රාජධානිය නිදහස් කර ගැනීමට පෘතුගීසීන්ගේ උපකාර ලබාගත්තේය.

B මහනුවර රාජධානියට සීතාවක රාජධානියෙන් එල්ල වූ තර්ජන නිසා පෘතුගීසීන්ට උඩරට රජවරුන්ගේ ආරක්ෂකයින් ලෙස ක්‍රියා කිරීමට අවස්ථාව ලැබෙණි.

C උඩරට සම්බන්ධයෙන් පෘතුගීසින් ගෙන ගිය උපක්‍රමික සබඳතා බිඳ වැටී පළමු වන විමලධර්මසූරිය රජුගෙන් පසුව යුදමය ක්‍රියාමාර්ග වලට මඟ පැදිණි.

D ක්‍රි.ව. 1617 දී දෙවන රාජසිංහ රජු හා පෘතුග්‍රීසීන් අතර දේශ සීමා සම්බන්ධ ගිවිසුමක් ඇති විය. (.....)

29. ලන්දේසි පාලන ප්‍රතිපත්ති,

A වෙළඳ සමාගමේ ප්‍රධානත්වයෙන් පරිපාලන රටාව සැලසුම් කර තිබීම.

B ලන්දේසි පාලන ප්‍රදේශ කොමන්ඩරි තුනකට බෙදා තිබීම.

C දේශීය අධිකරණ පද්ධතියේ හිතකර අංග ද ඇතුළත් නව උසාවි ක්‍රමයක් හඳුන්වා දීම.

D මුහුදු බඩ වැසියන්ට රෝම ලක්දේසි නීතිය හා යාපනයේ වැසියන්ට තේසවලාමෙයි නීතියක් හඳුන්වා දීම. (.....)

30. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය බලය තහවුරු වීම,

A ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය සතු වීමට ප්‍රංශය හා ඕලන්දය අතර ඇති වූ යුද ගැටුම හේතු වීම.

B බ්‍රිතාන්‍ය හා ප්‍රංශය අතර ඇති කර ගත් පැරිස් ගිවිසුම මගින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යට හිමි වීම.

C 1802 දී ද්විත්ව පාලනය අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය බ්‍රිතාන්‍ය කිරීටයට පැවරීම.

D ද්විත්වපාලනය අවසන් වීමෙන් පසුව ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ලෙස තෝමස් මෛට්ලන්ඩ් පහත රටට පැමිණීම. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය වරහන තුළ යොදන්න.**

31. මාගම රාජධානියේ ආරම්භක පාලකයා කවුද?

1. පණ්ඩුකාභය 2. දේවනම්පියතිස්ස 3. මහානාග
4. ගෝඨාභය 5. කාවන්තිස්ස (.....)

32. මහාවංසයෙහි ''බොහෝ පින් ද පව් ද රැස් කළේය'' යනුවෙන් හඳුන්වා ඇති රජතුමා කවුද?

1. වසභ 2. වලගම්බා 3. මහසෙන්
4. ධාතුසේන 5. පළමුවැනි කාශ්‍යප (.....)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

33. පැරණි අට දහස් රටෙහි අගනුවර කුමක්ද?
1. පුංබගාම 2. මහානාගහුල 3. උදුන්දොර
4. උරුවේලාව 5. කතරගම (.....)

34. 1797 පහතරට මුහුදුබඩ ඇති වූ කැරැල්ලට බලපෑ ජනතා විරෝධයට ලක් වූ බද්ද කුමක්ද?
1. පොල්ගස්බද්ද 2. බලු බද්ද 3. තුවක්කු බද්ද
4. ධීවර බද්ද 5. කඩසාප්පු බද්ද (.....)

35. වීර හැන්නදිගේ ප්‍රැන්සිස්කු යනුවෙන් හැඳින්වෙන්නේ කවුද?
1. ගොංගාලේ ගොඩබණ්ඩා 2. කිවුලේගෙදර මොහොට්ටාල 3. දීනිස්
4. ඩිංගිරාල 5. පුරන් අප්පු (.....)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 36 | මහාවංශයට අනුව වැව් තැනීම සඳහා ප්‍රථම වරට අනුග්‍රහය ලැබෙන්නේ අනුරාධපුරයේ ප්‍රථම පාලකයා වූ පණ්ඩුකාභය රජු විසිනි. | ක්‍රි.ව. පළමුවැනි සියවස වන විටත් මෙරට ඉදිකොට ඇති බව පෙනෙන්නේ කුඩා ගම් වැව් වන අතර විශාල වැව් ඉදිකිරීම ආරම්භ කරන ලද්දේ ක්‍රි.ව. පළමුවැනි සියවස අගභාගයේ දී වසභ රජු විසින් බව පිළි ගැනේ. (.....) |
| 37 | පළමුවැනි විජයබාහු රජුගේ අභාවයෙන් පසුව රට තුළ දේශපාලන වශයෙන් ඇති වූ අවුල් සහගත තත්ත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාව පාලකයන් හතර දෙනෙකු අතර බෙදී ගියේය. | පොළොන්නරුව රාජධානියේ බිඳ වැටීමට බලපෑ හේතුන් අතර ප්‍රධාන හේතුවක් වන්නේ සෙනෙවිවරුන්ගේ බලවත් වීම හා ඔවුන් දේශපාලනයට මැදිහත් වීමයි. (.....) |
| 38 | හයවැනි පරාක්‍රමබාහු රජුගේ පාලන සමයේ ලංකාවට මුල් වරට චීන ආක්‍රමණයක් සිදු විය. | උඩරට රාජධානියට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි දූතයා ස්පිල් බර්ජන් පළමුවැනි විමලධර්මසූරිය රජතුමා හමු වී සාකච්ඡා කළේය. (.....) |
| 39 | උඩරට ගිවිසුමේ වගන්ති කඩ කරමින් ඉංග්‍රීසින් ගෙන ගිය පාලනය කෙරෙහි උඩරට ජනතාව තුළ ඇති වූ කළ කිරීම වෙල්ලස්සෙන් ඇරඹුණ කැරැල්ල නිදහස් අරගලයක් දක්වා වර්ධනය විය. | 1848 නිදහස් අරගලයේ දී අත් අඩංගුවට ගත් ඇහැලේපොළ මුරිසි දිවයිනට පිටුවහල් කරන ලද්දේය. (.....) |
| 40 | කෝට්ටේ රාජධානියේ අවසාන සිංහල පාලකයා වන්නේ හත්වන බුවනෙකබාහු රජතුමාය. | පළමුවන රාජසිංහ රජුගේ මරණයෙන් පසුව ඇති වූ දේශපාලන අස්ථාවර බව සීතාවක රාජධානියේ පරිහානියට හේතු විය. (.....) |


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

ලංකා ඉතිහාසය II

කාලය පැය දෙකයි

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත් B හා C කොටස්වලින් එක ප්‍රශ්නය බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) ගෝකණ්ණ | (ii) මීගමුව | (iii) අනුරාධපුරය | (iv) කුරුණෑගල |
| (v) නාච්චාදූව වැව | (vi) සීතාවක | (vii) සූකරතිත්ථ | (viii) කලා ඔය |
| (ix) බලන | (x) පොම්පරිප්පු | (xi) යාපනය | (xii) දකුණු පළාත |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 බැගිනි)

## B කොටස

02. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩ ගැස්වීමෙහිලා අභ්‍යන්තර භූගෝලීය පිහිටීම ඉවහල් වී ඇති ආකාරය පහත දැක්වෙන සාධක ඔස්සේ සාකච්ඡා කරන්න.
   (i) තැනිතලා
   (ii) ගංගා හා ගංගා නිම්න
   (iii) වරායන් (ල. 16)

03. '' ශ්‍රී ලංකාවට බුදු දහම හඳුන්වා දීම ඉන්දු - ශ්‍රී ලංකා මිත්‍ර සබඳතාවල ප්‍රතිඵලයක් මෙන්ම අශෝක අධිරාජයාගේ දේශපාලන අරමුණුවල ප්‍රතිඵලයක් ද වෙයි''
   (i) ශ්‍රී ලංකාවට බුදු දහම හඳුන්වා දෙනු ලැබුවේ කීවෙනි සංඝායනාවක ප්‍රතිඵලයක් වශයෙන් ද? (ල. 1)
   (ii) බුදු දහම ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන විට මෙරට පැවති ආගමික පසුබිම විමසන්න. (ල. 4)
   (iii) ආගන්තුක ආගමක් වූ බුදු දහම ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමට තුඩු දුන් හේතු විමසන්න. (ල. 5)
   (iv) ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීම හා ව්‍යාප්තිය කෙරෙහි දෙරටේ පාලකයින්ගේ දේශපාලන පසුබිම හා අරමුණු බලපා ඇති ආකාරය ඉහත ප්‍රකාශය ඇසුරින් විමසන්න. (ල. 6)

04. ''මහසෙන් රජු බොහෝ පින් ද පව් ද රැස් කළේය'' මහා වංශයෙහි ඉහත සඳහන් ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් මහසෙන් රජුගේ කාර්ය සාඵල්‍යය දී ඇති මාතෘකා ඔස්සේ විමර්ශනය කරන්න.
   (i) මහා විහාර විරෝධී ප්‍රතිපත්තිය
   (ii) ආගමික ප්‍රතිපත්තිය
   (iii) වැව් හා වාරිමාර්ග තැන වීම. (ල. 16)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   1. අනුරාධපුර යුගයේ පාලන තන්ත්‍රය
   2. පොළොන්නරු යුගයේ විදේශ සම්බන්ධතා
   3. කාලිංග මාඝ ආක්‍රමණය
   4. ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ හා කලා ශිල්ප

(එක් කෙටි සටහනකට ලකුනු 8 බැගින්)

## C කොටස

06. ''උඩරට රාජ නාමාවලියෙහි රජවරු ගණනාවක් සිටියද ඒ අතරින් ශ්‍රේෂ්ඨත්වයට පත්ව සිටින්නේ කිහිප දෙනෙකු පමණි''
   (i) උඩරට රාජධානියේ ආරම්භක පාලකයා කවුද? (ල. 1)
   (ii) උඩරට රාජධානියට ස්වාභාවික රැකවරණය සැපයූ දුර්ග මාර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 2)
   (iii) වර්ෂ 1594 සිට 1638 දක්වා උඩරට රාජධානියට එල්ල වූ පෘතුගීසි ආක්‍රමණ විමසන්න. (ල. 6)
   (iv) ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් දහසය වන සියවසේ අගභාගයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රබල රාජධානිය ලෙස මහනුවර රාජධානියේ නැගී ඒමට පළමුවැනි විමලධර්මසූරිය රජතුමාගේ ක්‍රියාකලාපය හේතු වූ ආකාරය සාකච්ඡා කරන්න. (ල. 7)

07. උඩරට රාජධානිය බිඳ වැටීමට බලපෑ සාධක විමසන්න. (ල. 16)

08. ''1833 වර්ෂය ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන ක්ෂේත්‍රයන්හි ප්‍රබල වෙනසක් ඇති කළ කඩ ඉම වන්නේය''
   (i) කෝල්බෲක් කොමිසම පත් කර එවීමට බලපෑ ප්‍රධාන හේතුව සඳහන් කරන්න. (ල. 1)
   (ii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා අතර තිබූ පරිපාලන හා ආර්ථික යෝජනා එක බැගින් සඳහන් කරන්න. (ල. 2)
   (iii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා යටතේ ක්‍රියාත්මක කළ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ විමසන්න. (ල. 6)
   (iv) 1848 දෙවන නිදහස් අරගලයට කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනාවලින් ඇති වූ බලපෑම විමසන්න. (ල. 7)

09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම 2ක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   1. යාපනය රාජධානිය
   2. ලන්දේසි ආර්ථික ප්‍රතිපත්ති
   3. ද්විත්ව පාලන ක්‍රමය
   4. 1815 උඩරට ගිවිසුම (එක් කෙටි සටහනකට ලකුණු 8 බැගිනි)

NWP - EXAM




මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

# 12 / 13 **ලංකා ඉතිහාසය** - 12 / 13 இலங்கை வரலாறு

විභාග අංකය
சுட்டெண்

| |
|---|
| |




**පළමු වාර පරීක්ෂණය - 2020**
**ලංකා ඉතිහාසය - 13 ශ්‍රේණිය**
**පිළිතුරු - 1 කොටස**

| | | | |
|---|---|---|---|
| (01) - 5 | (11) - 5 | (21) - 3 | (31) - 3 |
| (02) - 1 | (12) - 5 | (22) - 4 | (32) - 3 |
| (03) - 4 | (13) - 1 | (23) - 5 | (33) - 2 |
| (04) - 1 | (14) - 4 | (24) - 1 | (34) - 1 |
| (05) - 4 | (15) - 4 | (25) - 5 | (35) - 5 |
| (06) - 3 | (16) - 2 | (26) - 5 | (36) - 5 |
| (07) - 5 | (17) - 4 | (27) - 1 | (37) - 2 |
| (08) - 3 | (18) - 1 | (28) - 3 | (38) - 3 |
| (09) - 3 | (19) - 1 | (29) - 4 | (39) - 1 |
| (10) - 4 | (20) - 3 | (30) - 2 | (40) - 4 |

## 11 කොටස.

## A කොටස




## B කොටස

02. (i) * වියළි කලාපයට අයත් වීම.
* ජනාවාස බිහි වීම හා ව්‍යාප්තිය සිදුවීම.
* රාජධානි බිහි වීම.
*කඳුකරයෙන් ආරම්භ වී තැනිතලා ඔස්සේ ගලා බසිනා ගංග උපයෝගි කොටගෙන වාරිකර්මාන්තය බිහි වීම.
* සරුපස හා ජල පහසුව නිසා කෘෂි කර්මාන්තය ප්‍රධාන වීම.
* ජලාශ්‍රිත ශිෂ්ටාචාරය බිහි වීම.

(ii) * මධ්‍ය කඳුකරයෙන් ආරම්භ වී අභ්‍යන්තර තැනිතලාව ඔස්සේ ගලා බැසීම.
* එමගින් වියළි කලාපය පෝෂණය වීම.
* ජනාවාස බිහි වීමට හා ව්‍යාප්ත වීමට හේතු වීම.
* රාජධානිවල දේශ සීමා ලෙස ගංගා යොදා ගැනීම. (උදාහරණ දක්වා තිබිය යුතුය)
* වාරිකර්මාන්තය දියුණු වීම.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

* රාජධානිවල අගනුවර ගංගාවක් ආශ්‍රිතව බිහි වීම.
* ගංගා මුවදොර වරායන් හා තොටමුණු නිර්මාණය වීම.
* එමගින් වෙළඳාම දියුණු වීම. (මෙම සියලු කරුණු උදාහරණ සහිතව දක්වා තිබිය යුතුය.)

(iii) * ද්වීපතක් වීම හා මධ්‍ය කඳුකරයෙන් ආරම්භ වී අභ්‍යන්තර තැනිතලා ඔස්සේ ගලා බසිනා ගංගා නිසා වරාය නිර්මාණය වීම.
* දිවයින වටා පිහිටි වරායන් හේතු කොටගෙන වෙළඳාම දියුණු වීම.
* සංක්‍රමණ හා ආක්‍රමණ සිදු වීම.
* ජනාවාස බිහි වීම හා ව්‍යාප්තිය
* වෙනස්වන ජාත්‍යන්තර තත්වයන් හමුවේ හැඩගැසෙන පරිදි වරායන් රැසක් තිබීම.
* යුරෝපා ජාතින්ගේ අවධානය යොමු වීම.

(මෙම කරුණු උදාහරණ මඟින් සනාථ කර තිබීම අවශ්‍ය වේ.) (ල. 16)

03. (i) තුන්වැනි ධර්ම සංඝායනාව

(ii) * සංවිධානාත්මක ආගමක් නොතිබීම.
* ස්වාභාවික වස්තූන් වන්දනාමාන කිරීම
* විවිධ ඇදහිලි පැවතීම.
* විවිධ ආගමික විශ්වාස පදනම් කරගත් ආගමික කණ්ඩායම් සිටීම.
* පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය සැලසුම් කිරීමේ දී විවිධ ආගමික කණ්ඩායම්වලට භූමිය වෙන් කිරීම. (උදාහරණ සහිතව ලියා තිබිය යුතුය) (ල. 4)

(iii) * බුදු දහම ලංකාවට පැමිණෙන විට මෙරට සංවිධානාත්මක ආගමක් නොතිබීම.
* බුදු දහම අවිහංසාවාදී දහමක් වීම.
* රටේ පාලකයා වූ දේවනම්පියතිස්ස රජු බුදු දහම වැළඳ ගැනීම.
* රජතුමා අනුව යමින් ඇමතිවරු ප්‍රමුඛ උසස් නිලධාරින් බුදු දහම වැළඳ ගැනීම.
* වෙහෙර විහාර ගැනීම. (ල. 5)

(iv) * ශ්‍රී ලංකාවේ මධ්‍ය පාලනය තහවුරු වී නොතිබීම.
* අනුරාධපුර රාජධානියට අමතරව ප්‍රාදේශිකව වෙනත් රාජධානි තිබීම.
* දේවනම්පියතිස්ස රජු එවකට බලවත්ම පාලකයා සමග මිත්‍ර සබඳතාව ගොඩ නගා ගැනීම.
* මහා වංසයට අනුව දේවනම්පියතිස්ස මුටසීව රජුගේ දෙවන පුත්‍රයා වීම.
* සිය රාජ්‍ය බලයට ආරක්ෂාවක් අවශ්‍ය ලෙස දේවනම්පියතිස්ස රජු කටයුතු කිරීම.
* ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යා කාලිංග යුද්ධයෙන් පසුව දිග් විජය ප්‍රතිපත්තිය අත හැර තිබීම.
* එම නිසා වින්ධ්‍යාවෙන් දකුණට පැවති ඉන්දියවේ දකුණු කොටස ස්වාධීනව පැවතීම.
* දකුණු ඉන්දියාවෙන් උතුරට සබඳතා අඩු වීම.
* එම නිසා ඉන්දියාවෙන් දකුණෙහි පිහිටා තිබූ ලංකාව කෙරෙහි අශෝක අධිරාජයා අවධානය යොමු කිරීම. (ල. 6)

04. (i) * මහායාන ධර්මයට එරෙහිව කටයුතු කළ ගෝඨාභය රජුගේ කණිටු පුත්‍රයා වීම.
* මහායානික භික්ෂුවක් වූ සංඝමිත්‍ර කුඩාකළ පටන් ගුරුවරයා වීම.
* එබැවින් රජු සංඝමිත්‍ර භික්ෂුවගේ මහායානික අදහස්වලට අනුව කටයුතු කිරීම.
* රජු මහා විහාරයට එරෙහිව කටයුතු කිරීම.
* මහාවිහාරවාසී භික්ෂූන්ට සිදු කළ හිරිහැර නිසා මේඝවර්ණාභය ඇමතිවරයා රජුට එරෙහි කැරළි ගැසීම.
* රජ පවුලෙන් සහ ඇමති මණ්ඩලයෙන් එල්ල වූ විරෝධය නිසා මහා විහාරයට කළ හිරිහැර නැවැත් වුවද ලබා දිය යුතු රාජ අනුග්‍රහය නිසි පරිදිලබා නොදීම.

උදාහරණ-: * මහා විහාරය ප්‍රතිසංස්කරණය කිරීම.
* මේඝවණ්ණාභය ඇමතිවරයා විසින් සිදු කිරීම.

* මහා විහාර සීමාව තුළම ජේතවන විහාරය කරවා සාගලික නිකායට පැවරීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ii) **ආගමික ප්‍රතිපත්තිය**
* නිදහස් මතධාරියකු ලෙස කටයුතු කිරීම.
* ජේතවන විහාරය සාගලික නිකායට පැවරීමෙන් තමන් මහා විහාරයට අවනත නොවන බව සංකේතාත්මකව ප්‍රකාශ කිරීම.
* දිවයිනේ විවිධ ප්‍රදේශවල බෞද්ධ වෙහෙර විහාර ඉදිකිරීම. මින්නේරි විහාරය, ගෝකණ්ණ විහාරය, කලන්දක විහාරය හා මෙහෙණි ආරාම දෙකක් ද ඉදි කිරීම.
* ගෝකණ්ණ විහාරය ඉදි කරන්නට පෙර එම ස්ථානයේ තිබූ හින්දු කෝවිලක් බිඳ දැමූ බව මූලාශ්‍රවල සඳහන් වේ. මෙයින් රජු බෞද්ධ විරෝධියකු නොවන බව තහවුරු වීම.

(iii) **වැව් හා වාරිමාර්ග තැනවීම.**
* දිවයිනේ විවිධ ප්‍රදේශවල වැව් හා ඇළමාර්ග තැනවීම.
(උදාහරණ දක්වා තිබිය යුතුය)
* කෘෂිකර්මාන්තයට කරන ලද සේවය නිසා ජනතාව විසින් මින්නේරි දෙවියන් ලෙස දේවත්වයට පත් කිරීම.
* මහා විහාරයට විරුද්ධව කළ ක්‍රියා නිසා ඇති වූ අපවාදයට වඩා කෘෂිකාර්මිකත්වයට සිදු කළ මෙහෙය නිසා ජනතාවගේ ප්‍රසාදය ලැබීම. (ල. 16)

05. (i) **කෙටිසටහන්**
* රාජාණ්ඩු ක්‍රමයක් වුවද ජනසම්මතවාදී වීම.
* බුදු දහමේ බලපෑම හේතු කොටගෙන දශරාජ ධර්ම අනුගමනය කිරීම.
* ඉන්දියානු රාජධර්මවල ආභාශය ද තිබීම. (මනුනීති)
* මෙය දේවනම්පියතිස්ස රජ සමයේ සිට දක්නට ලැබීම.
* පණ්ඩුකාභය රජ සමයේ මධ්‍ය පාලනයට පදනම දැමීම.
* සංවිධානාත්මක පරිපාලන ක්‍රමයක ආරම්භය
* අනුරාධපුරය කේන්ද්‍ර කරගෙන රජරට ශිෂ්ටාචාරය බිහි වීම.
* මායා රට (දක්ෂිණ දේශය) හා රුහුණු ප්‍රාදේශික රාජධානි වශයෙන් පැවතීම.
* මධ්‍ය පාලනයට සම්බන්ධ පරිපාලන තනතුරු පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍ර වලින් හා අභිලේඛනවලින් හෙළිවීම. (උදාහරණ සහිතව ලියා තිබිය යුතුය)

(ii) පළමැනි විජයබාහු, පළමුවන පරාක්‍රමබාහු හා නිශ්ශංකමල්ල රජවරුන්ගේ විදේශ ප්‍රතිපත්තිය ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.

**පළමුවන විජයබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය**
* විවාහා සබඳතා මගින් විදේශ සබඳතා ගොඩනගා ගැනීම.
* දකුණු ඉන්දියාවේ චෝළ විරෝධි රටවල් සමඟ එම සබඳතා ගොඩ නගා ගැනීම.
* පසු කළෙක පොළොන්නරු දේශපාලන උරුමයට විදේශික රජ පෙළපත් උරුමකම් කීම.

**පළමුවන පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය**
* බුරුම ආක්‍රමණය
* සෙල්ලිපි මගින් තහවුරු වීම.
* පාණ්ඩ්‍ය දේශයේ සිංහාසන අර්බුදය විසඳීමට මැදිහත් වීම හා දකුණු ඉන්දියාවට ලංකා හමුදාව යවා ආක්‍රමණය කිරීම.
* කාම්බෝජය සමග පැවැත් වූ සබඳතා
* චීනය සමඟ පැවැත් වූ සබඳතා

**නිශ්ශංකමල්ල රජුගේ විදේශ ප්‍රතිපත්තිය**
* චෝළ විරෝධි ප්‍රතිප්තියක පිහිටා කටයුතු කිරීම.
* පෙර රජවරු මෙන් ම පාණ්ඩ්‍ය වංශිකයන්ට අනුග්‍රහය දක්වමින් සබඳතා පවත්වාගෙන යෑම.
* චතුරංගනි සේනාව පිරිවරාගෙන දකුණු ඉන්දියාවට ගිය බව සෙල්ලිපි මගින් තහවුරු වීම.
* දකුණු ඉන්දියාව ආක්‍රමණය කළ බව ප්‍රකාශ වුවද එය සනාථ කිරීමට සාක්ෂි නොමැති වීම.

(iii)
* රජරට ශිෂ්ටාචාර සමයෙහි එල්ල වූ බිහිසුණුම ආක්‍රමණය වීම.
* කෲර හා අමානුෂික හැසිරීම.
* කේරළයෙන් පැමිණි බව ප්‍රකාශ කිරීම.
* රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීම.
* පොළොන්නරු රාජධානි සමය තුළ වර්ධනය වී තිබූ කාලිංග - පාණ්ඩ්‍ය බල අරගලයේ ප්‍රතිඵලයක් ලෙස උපකල්පනය කලහැකි වීම.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iv) * චෝළ ආභාසය දක්නට ලැබීම.
* දේවාල හා විහාර ගෙවල් එකට ගොඩ නැගීම ආරම්භ වීම.
(නිදසුන් සහිතව ලියා තිබිය යුතුය)

එක කෙටි සටහනකට ලකුණු 8 බැගිනි.

## C කොටස

06. (i) සේනා සම්මත වික්‍රමබාහු (ල. 1)

(ii) බලන, ගලගෙදර, කඩුගන්නාව - (මේ අතරින් පිළිතුරු දෙකක් ලියා තිබිය යුතුය) (ල. 2)

(iii) දන්තුරේ, බලන, රන්දෙනිවෙල, ගන්නෝරුව සටන් ඇසුරින් පිළිතුර සකස් විය යුතුය (ල. 6)

(iv) * සීතාවක රාජසිංහ රජුගේ ක්‍රියාකලාපය හමුවේ පෘතුගීසින්ට එක් වුව ද තීරණාත්මක අවස්ථාවේ දී උඩරැටියෙකු ලෙස ක්‍රියා කිරීම.
* පෘතුගීසි සැලසුම් පරාජය කර රාජ්‍යත්වය තහවුරු කිරීම.
* පේරාදෙණි පෙළපත නමින් නව රජ පෙළපතක් ආරම්භ කිරීම.
* නායක්කාර්වරුන්ට බලය හිමි වන තෙක් එම පෙළපත උඩරට පාලනය කිරීම.
* කෝට්ටේ හා සීතාවක රාජධානි අභාවයට යද්දී අහිමි වී ගිය සිංහල බෞද්ධ උරුමය හා සංස්කෘතිය උඩරටින් ආරම්භ කිරීම.
* දළදාවහන්සේ මහනුවරට වැඩමවා දළදා මැදුරක් ඉදි කර එහි තැන්පත් කිරීම.
* අද දක්වා දළදා උරුමය මහනුවරට ලැබීම.
* දේශපාලනික හා ආර්ථික වශයෙන් මහනුවර රාජධානිය ශක්තිමත් කිරීම. (ල. 7)

07. උඩරට රාජධානිය බිඳ වැටීම කෙරෙහි අභ්‍යන්තර සාධක මෙන්ම බාහිර සාධකවල ද තීරණාත්මක බලපෑම අභ්‍යන්තර සාධක
* නායක්කර්වරු බලයට පත් වීමෙන් පසුව උඩරට රාජ සභාව තුළ නායක්කර්වරුන්ගේ බලය වර්ධනය වීම.
* නායක්කර්වරුන්ට එරෙහිව සිංහල රදල ප්‍රධානීන් පිරිසක් කටයුතු කිරීම.
* කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ ආරම්භ වූ සිංහල රදල - නායක්කාර් ප්‍රතිවිරෝධය ශ්‍රී වික්‍රමරාජසිංහ රජ සමයේ උච්ච අවස්ථාව පැමිණීම.
* ශ්‍රී වික්‍රමරාජසිංහ රජු මෙම ප්‍රතිවිරෝධතාව හමුවේ තම බලය තහවුරු කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග
* උඩරට රාජ සභාවේ සිංහල රදලවරුන්ගේ එදිරිවාදිකම් තම වාසියට හරවා ගැනීම.
* රජුගේ කෲර ක්‍රියා කලාපය
* බාහිර හේතුන් අතර
* තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ පාලන සමයේ අනුගමනය කළ උපක්‍රමික ක්‍රියාමාර්ග
* ජෝන් ඩොයිලිගේ චර පුරුෂ සේවාව
* රජුගේ කෲර ක්‍රියාකාරකම් නිසා උඩරට රාජධානියට මැදිහත් වීමට ඉංග්‍රීසීන්ට අවස්ථාව උදාවීම.

1803 ඉංග්‍රීසීන්ගේ පළමු ආක්‍රමණය අවස්ථවේදී රජුට ලැබුණ සහය 1815 දී නොලැබීම.

(ල. 16)

08. (i) යටත් විජිතයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආදායමට වඩා වියදම ඉහළ ගොස් අය - වැය හිඟයකට මුහුණ දීම.

(ii) **පරිපාලන යෝජනා**
* උඩරට හා පහත රට ඒකාබද්ධ කිරීම.
* දිවයින පළාත් පහකට බෙදීම.
* සිවිල් සේවය ප්‍රතිසංස්කරණය කිරීම.

**ආර්ථික යෝජනා**
* අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
* රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම.
* රජයේ ඉඩම් හිමිකම පිළිබඳ ප්‍රතිපත්ති වෙනස් කිරීම.


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

* ඉඩම් විකිණීමට හැකි පරිදි නීති ගෙන ඒම.
* බදු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම.
* පෞද්ගලික ව්‍යවසාය දිරිමත් කිරීම.

(මෙම ප්‍රතිපත්ති අතරින් දෙකක්) (ල. 2)

(iii) * ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහුටුවීම.
* ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා කිරීම.
* නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලාරම්භක අවස්ථාව වීම යන කරුණු යටතේ පිළිතුරු සකස් වී තිබිය යුතුය.

(iv) * උඩරට පහතරට ඒකාබද්ධ කිරීම නිසා උඩරටට ආවේණික සංස්කෘතික ලක්ෂණ බිඳ වැටීම.
* පහතරට වෙළඳුන් හා ධනවතුන් උඩරටට පැමිණීම.
* වියදම් අඩු කර ගැනීම සඳහා සිවිල් සේවකයන්ගේ වැටුප් වේතන අඩුකර ඒ වෙනුවට වතු වගාවේ නිරත වීමට අවසර දීම.
* එම නිසා සිවිල් සේවකයන් තම රාජකාරියට වඩා වතු වගාවට මූලිකත්වය දීම.
* පළාත් දහසය පළාත් පහ දක්වා අඩු පරිපාලන ප්‍රදේශ විශාල වීම නිසා ජනතා ගැටලු විසඳීම පමා වීම හා අතපසු වීම.
* අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා ගම්සභාවේ කාර්යය පවත්වා ගෙන යෑමට අවශ්‍ය මානව සම්පත නොමැති වීම.
* එම නිසා ග්‍රාමීය සංවර්ධනය අඩාල වීම.
* ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය නිසා උඩරට ඉඩම් විශාල ප්‍රමාණයක් විකිණීම.
* 1840 මුඩුබිම් පනත නිසා පාරම්පරික ගොවියන්ගේ ඉඩම් අහිමි වී ඉඩම් අහිමි ජනතාවක් බිහි වීම.
* කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ නිසා ගම්සභාව සතුව තිබූ සුළු අධිකරණ බලය ද අහිමි වී නිශ්ක්‍රීය ආයතනයක් බවට පත් වීම.
* උඩරට සමාජ ක්‍රමය බිඳ වැටීම. (ල. 7)

09. (i) කෙටි සටහන්

**යාපනය රාජධානිය**

* මූලාශ්‍ර -: යාල්පාන වෛපවමාලෛ, ශේගරාජ ශේඛර මාලෛ, කෛලාසමාලෛ
* දඹදෙණිය රාජධානිය ආක්‍රමණය කිරීමට පැමිණි ජාවක චන්ද්‍රබානුගේ පුත්‍රයා පාණ්ඩ්‍ය අධිරාජ්‍යයාගේ සහාය ඇතිව උතුරේ රාජධානියක් ආරම්භ කළ බවට නිගමනය කිරීම.
* යාපනය රාජධානියට විජය නගර් අධිරාජ්‍යයේ සහාය ලැබුණ බවට සාධක තිබීම.
* දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය බලය දුර්වල වීමෙන් පසුව ආර්ය චක්‍රවර්තීවරුන් යාපනයේ බලය අල්ලා ගැනීම.
* ආර්ය චක්‍රවර්තීවරුද දකුණු ඉක්දියාවෙන් පැමිණි පිරිසක් බවට නිගමනය කිරීම.
* ආර්ය චක්‍රවර්තී පෙළපතේ පාලකයන් දොළොස් දෙනෙකු (12) පිළිබඳව සඳහන් වීම.
* 14 වන සියවසේ දී ලංකාවට පැමිණි ඉබන් බතුතාගේ ලේඛනවල යාපනය පිළිබඳව සඳහන් වීම.
* iii වන වික්‍රමබාහු රජුගේ පාලන සමයේ ගම්පොළ රාජධානියෙන් කප්පම් ලබා ගැනීමට තරම් බලවත් වීම.
* ගම්පොළ නිශ්ශංක අලගක්කෝණාර (අලකේශ්වර) කෝට්ටේ බලකොටුව තනා බටහිර වෙරළ හා වරායන් නිදහස් කර ගැනීම.
* කනකශූරිය ශිංගෛ ආරියන්ගේ පාලන සමයේ කෝට්ටේ 6 වැනි පරාක්‍රමබාහු රජු සපුමල් කුමාරයා යවා යාපනය යටත් කිරීම.
* 6 වැනි පරාක්‍රමබාහු රජුගේ මරණයෙන් පසුව කෝට්ටේ රාජධානිය තුළ ඇති වූ අභ්‍යන්තර ආරවුල් හේතුකොට ගෙන යලිත් ස්වාධීන වීම.
* පෘතුගීසි පාලන සමයේ සංකිලිගේ ක්‍රියාකලාපය.
* 1619 දී පෘතුගීසීන් විසින් යටත් කර ගැනීම.

(මෙම පියවර අනුව පිළිතුර ගොඩනගා තිබිය යුතුය)

(ii) **ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය**

* යුද්ධය නිරර්ථක වියදමක් ලෙස සලකා හැකිතාක් යුද්ධයෙන් වැළකී සිටීම.
* ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම විසින් ආර්ථිකය මෙහෙයවීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

* කුරුඳු ඇතුළු වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීමට ක්‍රියා කිරීම.
* පහතරට තම පාලන ප්‍රදේශ පාලනය කිරීම දේශීය ඉඩම් භුක්ති ක්‍රමය, කුල ක්‍රමය සහ සම්ප්‍රදායන් යොදා ගැනීමෙන් ලාභය වැඩි කර ගැනීම.
* වඩා වාසිදායක වෙළඳ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒකාධිකාරය පවත්වාගෙන යෑම (කුරුඳු, අලි ඇතුන් වෙළඳාම, පුවක් මැණික් සහ මුතු)
* පුවක් වෙළඳාම ප්‍රධාන අපනයන ආදායම් වර්ගයක් වීම නිසා උඩරට රාජ්‍ය සමග වෙළඳාම පවත්වාගෙන යෑම.
* උඩරට රාජ්‍යය සමග හැකිතාක් සුහදව කටයුතු කිරීම තුළින් වෙළඳ ද්‍රව්‍ය රැස් කර ගැනීම.
* වියදම් අඩු කර ගැනීමේ අරමුණින් දේශීය ආර්ථික ප්‍රතිපත්තිය පවත්වාගෙන යෑම.
  උදාහරණ -: ආහාර ද්‍රව්‍ය මෙරට වගා කිරීම.
  වැව් ප්‍රතිසංස්කරණය
  දේශිය කර්මාන්ත ඇති කිරීම.
* බදු ප්‍රතිපත්තිය ක්‍රමවත් කිරීම.
  (උදාහරණ සහිතව ලියා තිබිය යුතුය)

(iii) **ද්විත්ව පාලන ක්‍රමය**
* ඉංග්‍රිසි පෙරදිග ඉන්දීයා වෙළඳ සමාගම සහ බ්‍රිතාන්‍ය කිරීටය හවුලේ ගෙන ගිය පාලනය.
* 1798 - 1802 දක්වා ද්විත්ව පාලනය බල පැවැත්වීම.
* වෙළඳ සමාගමේ බදු ප්‍රතිපත්තියට එරෙහිව 1797 දී ඇති වූ පහතරට කැරැල්ල හේතු කොටගෙන කරුණු සෙවීමට පත්කළ මියුරන් කොමිසමේ නිර්දේශයක් අනුව පිහිටු වීම.
* කිරීට නියෝජිතයා ලෙස 1798 දී ආණ්ඩුකාරධූරයට ෆ්‍රෙඩ්රික් නෝර්ත් පත් කර එවීම.
* සමාගම් සේවකයන් ආණ්ඩුකාරවරයාට දැක් වූ අකමැත්ත
* සමාගමට වෙළඳ හා වාණිජ කටයුතුත් පරිපාලනය බ්‍රිතාන්‍ය රජයටත් පැවරීම.
* සමාගම ආණ්ඩුකාරවරයා සමග සුහදව කටයුතු නොකිරීම නිසා අසාර්ථක වීම.
*1802 දී සමාගම් පාලනය අහෝසි වී ආණ්ඩුකාරවරයා මුහුදුබඩ ප්‍රදේශවල නිත්‍ය නියෝජිතයා ලෙස කිරීටය නියෝජනය කිරීමට පටන් ගැනීමෙන් පසුව ද්විත්ව පාලනය අවසන් වීම.

(iv) * 1815 මාර්තු 02 වැනි දින බ්‍රිතාන්‍ය රජය වෙනුවෙන් රොබට් ආණ්ඩුකාරවරයා සහ උඩරට රදළ ප්‍රධානීන් අතර ඇති කර ගත් ගිවිසුම
* වගන්ති 12 කින් යුත් උඩරට ගිවිසුම තුළින් උඩරට රාජධානියේ රාජ්‍යත්වය අහෝසි වී බ්‍රිතාන්‍ය පාලනය පිළි ගැනීම.
* 1, 2, 3 වගන්ති තුළින් නායක්කාර් වංශයට මෙරට රාජ්‍යත්වය ඉසලීමේ හැකියාව අහෝසි කිරීම.
* බ්‍රිතාන්‍ය රජයට උඩරට රාජ්‍ය බලය පැවරීම.
* 4 වන වගන්තියෙන් රදළ වරප්‍රසාද ආරක්ෂා කරන බවට පොරොන්දු වීම.
* 5 වන වගන්තියෙන් බුදු දහම හා දේවාගම කඩ නෙකොට පවත්වාගෙන යන බව සහ බුදු දහම ආරක්ෂා කරන බව
* 6, 7 වගන්තිවලින් අංග ඡේදනය වැනි අමානුෂික දඬුවම් තහනම් කරන බවත් ආණ්ඩුකාරවරයාට හැර වෙනත් අයෙකුට මරණ දඬුවම පැන වීමට නොහැකි බව.
* 8 වගන්තියෙන් සිවිල් වැසියන්ගේ නඩුසම්බන්ධ බලතල පෙර පරිදිම රදළ ප්‍රධානීන් සතු වන බව
* 9 වන වගන්තියෙන් හමුදා නිලධාරීන් සඳහා හමුදා නීතිය බල පවත්වන බව
* 10 වන වගන්තියෙන් හමුදා මෙහෙයුම්වලට අදාළ ආඥා අවලංගු කරන බව
* ඉංග්‍රිසි රජු වෙනුවෙන් උඩරට ආදායම් රැස් කිරීමට ඒජන්තවරු යොදවන බව 11 වන වගන්තියෙන් ප්‍රකාශ වීම.
* 12 වන වගන්තියෙන් උඩරට හා පහත රට අතර වෙළඳාමට ඇති බාධා ඉවත් කිරීම හා ඒ සම්බන්ධ වෙනත් නම් සිදු කිරීමේ අයිතිය ඉංග්‍රිසී ආණ්ඩුව සතු බව ප්‍රකාශ කිරීම.

මෙම වගන්ති නොසලකා හැර ඉංග්‍රීසි ආණ්ඩුවේ බලය තහවුරු කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග නිසා උඩරට රදළයින්ද, භික්ෂුන් ද සාමාන්‍ය වැසියන් ද එක්ව 1818 දී කැරැල්ල ඇති කළහ.

(එක් කෙටි සටහනකට ලකුණු 8 බැගිනි)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES




Protect Yourself From Coronavirus
YOU STAY AT HOME
DELIVERY
WE DELIVER!
ORDER NOW
075 699 9990
WWW.LOL.LK

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART





GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00